**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 03/93 (1)**

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1993.04.28.

සියළුම ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රජයට අයත් ආයතනවල ප්‍රධානීන්.

**පළාත් සභා ඡන්ද විමසීම් - 1993 කාර්ය මණ්ඩල සහ**
**<u>භාණ්ඩ හා ද්‍රව්‍ය ප්‍රවාහනය සඳහා වාහන</u>**

අංක. 03/93 හා 1993 පෙබරවාරි මස 22 දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනයට වැඩිමනත් වශයෙනි.

02. රජය විසින් ගන්නා ලද පහත සඳහන් තීරණයන් කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

(අ) සියළුම අමාත්‍යාංශ, රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, කළමනාකරණ සමාගම් මගින් පාලනය වන රජය සතු වතු සහ අඩුතරමින් කොටස් සියයට 50 ක් රජය සතු පොදු සමාගම් ඇතුළුව, වෙනත් රජයේ ආයතන විසින්, අංක 03/93 හා 93.02.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුකූලව, සිය වාහන මැතිවරණ කොමසාරිස්වරයා වෙත මුදහැරිය යුතුය.

(ආ) මැතිවරණ කොමසාරිස්වරයා විසින්, අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත. එක් එක් රාජ්‍ය අංශයේ සංවිධානයට හෝ ආයතනයට, සිය අත්‍යාවශ්‍ය සේවා පවත්වාගෙන යාම පිණිස අවශ්‍ය අවම වාහන සංඛ්‍යාව රඳවා ගැනීමට අවසර දෙනු ඇත.

(ඇ) මෙකී රාජ්‍ය අංශයේ සංවිධාන සහ ආයතන විසින් මැතිවරණ කොමසාරිස්වරයා වෙත මුද හරිනු ලබන වාහන සම්බන්ධයෙන් කුලී ගාස්තු ගෙවීමක් නොකරනු ඇත. කෙසේ වුවද, මැතිවරණ කොමසාරිස්වරයා විසින් සිරිත් පරිදි, වාහන සඳහා ඉන්ධන, තෙල් ආදියෙහි පිරිවැය සහ රියැදුරන්ගේ සහ ක්ලීනර්වරුන්ගේ බටා, අතිකාල දීමනා සහ අනෙකුත් දීමනා පිළිබඳ පිරිවැය දරණු ඇත.

(ඈ) සියයට 50 ට අඩු කොටස් ප්‍රමාණයක් රජය සතු පොදු සමාගම් වලින්, ප්‍රථමකොට සිය වාහන, මැතිවරණ කොමසාරිස්වරයාට මුදහරින ලෙස ඉල්ලා සිටිනු ඇත. එසේ මුදහරිනු ලබන වාහන වෙනුවෙන්, මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලබන කුලී ගාස්තුවක් ගෙවනු ඇත.

ඉහත සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීමට කරුණාකර වහාම කටයුතු කරන්න.

අ,කලේ/ එම්.එන්. ජුනයිඩ්.
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය